අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
සිංහල භාෂා ඒකකය

280

# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2023

පළාත් මට්ටම

01. අපේක්ෂකයාගේ නම : ..........................................................................
(මුලකුරු සමග නිවැරදිව ලියන්න)
02. විදුහලේ නම සහ ලිපිනය : ..........................................................................
03. පාසල් වර්ගය : 200 අඩු / 201-500 තෙක් /500ට වැඩි
04. කලාපය : ..........................................................................
05. පළාත : ..........................................................................

## ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

**10 ශ්‍රේණිය**

**කාලය පැය 03යි.**

I කොටසින් එකක් ද II කොටසේ (අ) යටතේ එකක් ද (ආ) යටතේ එකක් ද (ඉ) යටතේ එකක් ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

### I කොටස

1. **පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 350 - 400 අතර රචනයක් ලියන්න.**

(අ) සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය වර්තමානය වන විට ශීඝ්‍ර දියුණුවක් අත්කර ගෙන ඇත. එමගින් එදිනෙද ජන ජීවිතයේ බොහෝ කාර්ය වඩාත් පහසුවෙන් ඉටු කර ගැනීමට හැකි වී ඇත. විශේෂයෙන් අධ්‍යාපන කටයුතු විෂයෙහි මෙම තාක්ෂණයෙන් ලබා ගත හැකි ප්‍රයෝජන අසීමිත ය. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් **රටෙහි සංවර්ධනය සඳහා සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණය යොද ගනිමු** මැයෙන් රචනයක් ලියන්න.

(ආ) යෞවනයන්ගේ ලෝකය විෂය කොට ගෙන ලියැවෙන යෞවන සාහිත්‍ය කෘති බොහොමයකි. යොවුන් වියේ දරුවන් සාහිත්‍ය පරිශීලනයෙන් දුරස් වුව හොත් ඔවුන්ට මෙම යොවුන් සාහිත්‍ය නිර්මාණ ද මග හැරී යාමට හැකි ය. හරසුන් දේ වෙනුවට යොවුන් සාහිත්‍යය වෙත සමීප වුවහොත් එයින් ලද හැකි සරුඵල ඉමහත් ය. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් **යෞවන සාහිත්‍ය නිර්මාණ පරිශීලනයේ වැදගත්කම** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඉ) වර්තමාන සමාජය පුරා විවිධාකාර වූ ගැටුම් පැන නැගී තිබේ. මෙම ගැටුම් සඳහා විවිධ හේතුසාධක බලපා ඇත්තේ ය. ගැටුම් නිරාකරණය කර ගැනීමෙන් අත් වන වාසි බොහොමයකි. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් **ගැටුම් නිරාකරණයෙන් සාමය පිරි ලොවක් ගොඩ නගමු** යන මැයෙන් රචනයක් ලියන්න.

(ඊ) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය විෂයෙහි කෘෂිකාර්මික ක්ෂේත්‍රය ප්‍රාමාණික දායකත්වයක් සපයයි. මෙහිදී අපනයන කෘෂි භෝග සංවර්ධනයෙන් බොහෝ වාසි ලබා ගත හැකි ය. ඒ සඳහා ගොවීන් වෙත අවශ්‍ය පහසුකම් සැපයීමට වගකිවයුතු පාර්ශ්ව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් **ශ්‍රී ලංකාවේ අපනයන කෘෂිකර්මාන්තය නගා සිටුවමු** යන මැයෙන් රචනයක් ලියන්න.

(උ) ජන සාහිත්‍යය අතීත ජනයාගේ දිවිපෙවෙත පිළිබිඹු කරන කැඩපතක් බඳු ය. ජන කවි, ජන කතා ඇතුළු නිර්මාණ රාශියකින් මෙම සාහිත්‍යය පෝෂණය වී ඇත. ජන සාහිත්‍යය රස විඳීම මෙන් ම සංරක්ෂණය ද කාලෝචිත අවශ්‍යතාවකි. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් **ජන සාහිත්‍යය පරිශීලනයේ වැදගත්කම** යන මැයෙන් රචනයක් ලියන්න.

(ලකුණු 40 යි.)



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more! CamScanner

## II කොටස

(අ) (i) කෘෂිකර්ම සංගමය මඟින් ඔබ පාසලෙහි 'කුළුබඩු උද්‍යානයක්' සකස් කිරීම සුදුසු යැයි යෝජනාවක් ඉදිරිපත් කර ඇත. මේ සඳහා අවශ්‍ය තොරතුරු හා පුහුණු කටයුතු පිළිබඳ විස්තර සපයා දෙන ලෙස ඉල්ලා ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන නිලධාරි වෙත යවන **ලිපිය** ලියන්න.

(ii) ඔබේ පාසලේ ඉගෙනුම ලබන ශ්‍රවණාබාධිත ශිෂ්‍යයෙකු සඳහා අවශ්‍ය ශ්‍රවණාධාර උපකරණ කට්ටලයක් ලබා දීමට, පාසල් බෞද්ධ සංගමය තීරණය කර ඇත. එම ශ්‍රවණාධාර උපකරණවල මිල ගණන් විමසමින් ඒවා සාධාරණ සහන මිලකට ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ලෙස ඉල්ලා 'සවනට සවියක්' සමාගමේ කළමනාකරු වෙත යවන **ලිපිය** ලියන්න.

(ලකුණු 20 යි.)

(ආ) (i) විකසිතගම වාසය කරන රෝගී තත්ත්වයෙන් පසුවන දිළිඳු පවුලක් පිළිබඳ රූපවාහිනී වැඩසටහනක් පොහොය දින ප්‍රචාරය විය. මේ පිළිබඳ අවධානය යොමු කළ " සැමට දිරියක්" සංවිධානය එම පවුල වෙත උපකාර කිරීමට ඉදිරිපත් විය. එමෙන් ම එම පවුලේ සාමාජිකයන්ගේ රෝගී තත්ත්වය සුවපත් කිරීමට අවශ්‍ය කටයුතු ද සම්පාදනය කෙරිණි. මෙම සිදුවීම පාදක කොට ගෙන ඔබ එම අවස්ථාව සඳහා සහභාගි වූ වාර්තාකරුවෙකු යැයි සිතා පුවත්පතකට සුදුසු **පුවත්පත් වාර්තාවක්** සකස් කරන්න.

(ii) සිංහල භාෂා දිනය නිමිති කොට ගෙන , සාහිත්‍ය උළෙලක් පැවැත්වීමට ඔබ පාසලේ සාහිත්‍ය සංගමය කටයුතු යොදා ඇත. සිසුන්ගේ රසවින්දන කුසලතා ඔප්නැංවීමේ වැඩසටහන් කිහිපයක් මෙන් ම විචිත්‍රාංග ද මෙම උළෙලට එක් කිරීමට කටයුතු යොදා ඇත. භාෂා ප්‍රවීණයන් රැසකගේ සහභාගිත්වයෙන් පැවැත්වෙන මෙම උළෙලෙහි **න්‍යාය පත්‍රය** සකස් කරන්න.

(ලකුණු 20 යි.)

(ඉ) (i) 'දිදුලගම' ගම්මානයේ වාසය කරන ජනතාව අතර බෝ නොවන රෝගවල ශීඝ්‍ර ව්‍යාප්තියක් දක්නට ලැබේ. මෙම රෝග උවදුරෙන් ජනතාව ගලවා ගැනීම සඳහා ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මඟින් වෛද්‍ය සායන ඇතුළත් වැඩසටහන් රැසක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. ඒ වැඩසටහන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු **අත්පත්‍රිකාවක්** සකස් කරන්න.

(ii) ඔබ පාසලේ දහවන ශ්‍රේණියේ සිසුන්ගේ හා දෙමාපියන්ගේ දායකත්වයෙන් සුප් දන්සැලක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම සුප් දන්සැල පැවැත්වීමට අපේක්ෂා කරන්නේ ඔබ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ සනීපාරක්ෂක කටයුතු සඳහා සහාය වන පිරිස වෙනුවෙනි. මෙම වැඩසටහන සඳහා සහයෝගය ලබා දෙන මෙන් ඉල්ලා පාසල් ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු **දැන්වීමක්** සකස් කරන්න.

(ලකුණු 20 යි.)

PAST PAPERS WIKI



CamScanner